ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල-2013

---

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 5 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 61 වගන්තිය යටතේ සාදන ලද 1994 අංක 1 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ නියෝග මාලාවේ අංක 12 දරන නියෝගය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවෙහි දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්, විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

----------------

**2.1** තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) චිත්‍රපට සංස්ථාවෙන් චිත්‍රපට කුළී දායකත්වය වෙනුවෙන් ලැබිය යුතු මුදල ණයගැති ගිණුමට හර කර තිබු අතර, ආදායම් ගිණුමට බැර කරනවා වෙනුවට තාවකාලික ණය හිමි ගිණුමකට බැර කිරීම දිගින් දිගටම සිදුකර තිබුණි. මෙකී මුදල් කිසිදු අවස්ථාවක නිරවුල් කර නොතිබුණද අඛණ්ඩව පැවති ණයහිමි හා ණයගැති ගිණුම්වල ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු.12,573,744 හා රු.20,506,930 ක් විය. මෙම වෙනසට හේතුන් හඳුනාගෙන නියමිත වර්ෂයන්වල ආදායම් ඒ ඒ වර්ෂ තුළදී හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙසේ ණයහිමි ගිණුමට බැර කළ ආදායම රු.1,655,486 ක් විය.

(ආ) විදේශීය චිත්‍රපට නිෂ්පාදන අධීක්ෂණය වෙනුවෙන් වූ ආදායම් හා වියදම් පිළිවෙලින් රු.818,500 හා රු.677,125 වෙන් වෙන්ව හඳුනා නොගෙන ශුද්ධ ශේෂය පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම් නොකළ යුතු අවස්ථා 03 කදී රු.1,042,355 ක් බැර කිරීම මඟින් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.1,042,355 කින් ඌණගණනය කර තිබුණි.

2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

පහත සඳහන් සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(අ) ගෙවිය යුතු නිෂ්පාදන ගිණුමේ රු.1,477,210 ක ශේෂයට අදාල උපයෝගී ලියවිලි හා අනෙකුත් උපලේඛන.

(ආ) 2012 වර්ෂයේදී ගෙවිය යුතු රු.999,315 ක ආදායම් බදු රඳවා ගැනීමේ බදු වලින් හිලව් කර තිබුණද බදු ගණනය කිරීමේ විස්තරය විගණනයට ඉදිරිපත් නොවිය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ චිත්‍රපට නිෂ්පාදන ණයගැති ශේෂය රු.64,682,582 ක් වී තිබුණු අතර එම ශේෂයෙන් සියයට 99.8 ක් හෙවත් රු.64,554,331 ක් වසර පහකට වැඩි කාලයක සිට පරිශේෂව පැවතුණි. චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදී තිබූ ණය මුදල් වෙනුවෙන්

වු කිසිදු මුදලක් 2013 වර්ෂයේදී ආපසු ලැබී නොතිබූ අතර චිත්‍රපට නිෂ්පාදන ණය ශේෂයෙන් අය කරගත නොහැකි බවට ඇස්තමේන්තු කර තිබූ ණය ප්‍රමාණය රු.60,784,558 ක් හෙවත් සියයට 94 ක් වී තිබුණි.

(ආ) අරමුදල පවත්වාගෙන යාම සඳහා දේශීය හා විදේශීය චිත්‍රපටවලින් චිත්‍රපට සංස්ථාවට අයවිය යුතු සංස්ථා භාරයෙන් සියයට 20 ක් අරමුදලට ලබාදෙන නමුත් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අරමුදලට ලැබිය යුතුව පැවැති චිත්‍රපට කුළී දායකත්වය රු.20,506,930 ක් වී තිබුණි.

(ඇ) අළුත්වැඩියාව හා නවීකරණය සඳහා සිනමාශාලා 3 ක් වෙත ලබා දී තිබුණු ණය මුදල් හා ඊට අදාල පොළී මුදලින් 2013 ජනවාරි 01 දින වන විට අයවිය යුතු ශේෂය රු.13,663,380 ක් වී තිබුණි. එම ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී අරමුදලට ආපසු ලද මුදල රු.566,614 ක් හෙවත් සියයට 04 ක් වී තිබුණි. සිනමාශාලා 02 කින් කිසිදු ණය වාරිකයක් අයවී නොතිබුණි.

(ඈ) අරමුදල විසින් නිෂ්පාදනය කර චිත්‍රපට සංස්ථාවට විකුණනු ලැබූ චිත්‍රපටයකින් 2005 වර්ෂයේ සිට අයවිය යුතුව පැවති රු.3,547,454 ක මුදලක් චිත්‍රපට සංස්ථාවෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන චිත්‍රපට සංවර්ධන අරමුදල සම්බන්ධ ගැසට් පත්‍රයේ<br>නියෝග අංක 6 (ඇ) | ප්‍රදානය කළ ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා අයවිය යුතු අධිභාරයන් නිශ්චය කර අයකර ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2000 ජුනි 12 දිනැති අංක පීඑෆ් / පීඊ / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2000 වර්ෂයේදී ආයෝජනය කර තිබුණු වටිනාකම රු. 2,000,000 ක් හා සමාලෝචිත වර්ෂයේදී ආයෝජනය කර තිබුණු රු.5,500,000 ක් වූ ස්ථාවර තැන්පතු සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල රු.4,635,230 ක බදු පෙර අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර අතිරික්තය රු.4,996,573 ක් වූයෙන් අතිරික්තයෙහි රු.361,343 ක් හෙවත් සියයට 7 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

4.1 කාර්යසාධනය
----------------

1994 අංක 1 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ නියෝග මාලාවේ අංක 4 දරන නියෝගය යටතේ (අ) සිට (ඕ) දක්වා වූ සංවර්ධන අරමුදලේ කාර්යයන් කිසිවක් 2013 වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිනමාශාලාවක් සඳහා ලබා දී තිබුණු ණය හා ඒ සඳහා පොළී මුදල වන රු. 2,355,959 න් කිසිදු ණය වාරිකයක් හෝ පොළී මුදලක් ආපසු අය කර ගැනීමට අරමුදල කිසිදු නීතිමය පියවරක් නොගෙන මුළු වටිනාකම අය කර ගත නොහැකි ලෙස ඇස්තමේන්තු කර ණයගැති ශේෂයෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එකී ණය මුදල අදාල කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණි.

(ආ) ජාතික චිත්‍රපට සංස්ථාව 2007 වර්ෂයේදී ඉන්දියාවේ පෞද්ගලික රසායනාගාරයක් සමඟ එක්වී චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඒ සඳහා මූලික වියදම් ලෙස රු.200,000 ක් වැය කර තිබුණද නිෂ්පාදකයකු සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් නිෂ්පාදනය අතහැර දමා එම මුදල අරමුදලේ චිත්‍රපට තොගයට ඇතුළත් කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
------------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම
---------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයද ඇතුළත් වන පරිදි සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය
--------------------------------

අරමුදල සඳහා අයවැය ලේඛනයක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ණය අයකර ගැනීම

(ආ) අධිභාර